ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - (බඳවාගැනීම් - කොරියානු අංශය)

**කොරියානු සේවා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ලිපිගොනු සම්පූර්ණ කිරීම හා ඉදිරි කටයුතු සඳහා උපදෙස්**

01. ඇපබැඳුම්කරය සහ ගිවිසුම සම්පූර්ණ කර නැවත භාරදීම.

- ඇප බැඳුම්කරය හා ගිවිසුම කාර්යාංශ වෙබ් අඩවියේ පළ කර ඇති අතර එහි මුද්‍රිත පිටපත් ලබා ගත යුත්තේ එකම පිටුවේ දෙපැත්තට (both side) සිටින ආකාරයටයි.
- ඇපබැඳුම්කරය, ඇපකරුවන් දෙදෙනෙකු (පවුලේ ඥාතියා හා රාජ්‍ය සේවකයා) සමඟ **විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණ කාර්යාංශ නීතිඥයෙකු ඉදිරියේදී අත්සන් කළ යුතුය.** (ගිවිසුම හා ඇපකරය මුල් පිටපත් 03 වශයෙන් කාර්යාංශයට භාර දිය යුතුය.)
- පළමු ඇපකරු පවුලේ ළඟම ඥාතියෙකු විය යුතුය. (බිරිඳ/ස්වාමියා/මව/පියා/සහෝදරයා/සහෝදරිය) ඔවුන් අතරින් සහෝදරයෙක්/සහෝදරියක් අත්සන් කරන්නේ නම් ඥාතීත්වය තහවුරු කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.විවාහක අයවලුන්ගේ පවුලේ ළඟම ඥාතියා බිරිඳ/ස්වාමියා විය යුතු අතර විවාහය සනාථ කිරීම සඳහා විවාහ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- දෙවන ඇපකරු දැනට රජයේ ස්ථිර සේවයේ නියුතු (සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළත්ය.) රු.25,000/= හෝ ඊට වඩා වැඩි මාසික දළ වැටුපක් ලබන අයෙකු විය යුතුය. එසේම විශ්‍රාම යාමට අවම වශයෙන් වසර 05ක් ඉදිරියට තිබිය යුතුය.( විශ්‍රාම යාමට නියමිත දිනය ද සේවා සහතිකයට ඇතුළත් විය යුතුය.)
- අදාළ ඇපකරුවන්ගේ හැඳුනුම්පත් වල පිටපත් ලිපිගොනු සම්පූර්ණ කිරීමේදී භාරදිය යුතුය (හැඳුනුම්පත නොමැති අවස්ථාවේදී ගුවන් ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය හෝ අනන්‍යතාවය තහවුරු කළ ග්‍රාමසේවක මහතා විසින් ලබාදෙන ලිපියක පිටපතක් මේ සඳහා වලංගු වේ.)
- ඇපබැඳුම්කරය පුරවන අවස්ථාවේදී සුදු තීන්ත (Tippex) භාවිතා කර නිවැරදි කිරීම් සිදු නොකළ යුතු අතර නිවැරදි ලෙස පැහැදිලි අත් අකුරින් පිරවිය යුතුය.නිවැරදි ලෙස පුරවා නොමැති ඇප බැඳුම්කර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඇපබැඳුම්කරයේ සහ ගිවිසුමේ සේවා කාලය ලෙස සඳහන් කළ යුත්තේ,සේවා ගිවිසුමේ සඳහන් කර ඇති කාල සීමාව වේ.
- නිෂ්පාදන සේවා ගිවිසුම අත්සන් කරන රැකියාලාභීන් නිෂ්පාදන ඇපබැඳුම්කරය හා ගිවිසුම ද, ධීවර සේවා ගිවිසුම අත්සන් කරන රැකියාලාභීන් ධීවර ඇපබැඳුම්කරය හා ගිවිසුම ද කාර්යාංශ වෙබ් අඩවියේ බාගත (download) කර ගත යුතුය.

**ඔබගේ පහසුව සඳහා ඇපබැඳුම්කරයේ පුරවන ලද සාම්පල් පෝරමයක් කාර්යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත.**

02. කාර්යාංශය වෙත ඇපබැඳුම්කරය නැවත භාරදීමේදී දෙවන ඇපකරුගේ සේවා ස්ථානයේ **ගිණුම්** අංශයෙන් සහතික කරන ලද වැටුප් **වාර්තාවක් සහ සේවා ආයතනයේ ප්‍රධාන ලිපි ශීර්ෂය සහිතව සේවයට බැඳුණු දිනය, විශ්‍රාම යන දිනය හා සේවය ස්ථිර ද යන වග ඇතුළුව සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.**

- පාසලක නම් එහි ප්‍රධාන ලිපි ශීර්ෂය සහිතව සේවා සහතිකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. එසේ ලිපි ශීර්ෂය නොමැති නම් සේවා සහතිකය අදාළ කලාප කාර්යාලයෙන් සහතික කර ඉදිරිපත් කළ යුතුය. එසේම වැටුප් වාර්තාව අදාළ **කලාප කාර්යාලයේ ගිණුම්** අංශයෙන් සහතික කර ලබා ගැනීම අනිවාර්යය වේ.
- වැටුප් වාර්තාව හා සේවා සහතිකය සහතික කරනු ලබන නිලධාරියාගේ නම, තනතුර සහිතව නිල මුද්‍රාව තබා අත්සන් කළ යුතුය.
- වැටුප් වාර්තාව සහ සේවා සහතිකය **"කළමණාකරු"**, බඳවාගැනීම් - කොරියානු අංශය, විදේශ **සේවා නියුක්ති කාර්යාංශය, බත්තරමුල්ල යන ලිපිනය සඳහන් කරමින් ලබා ගත යුතුය.**